**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 01 - 2021**

---

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 01 හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස් එල් -පී 110 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති ලියවිල්ලේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කලයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘති සංදේශයට හා ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.ව්‍යාපෘතියේ අරමුණු වනුයේ අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩිකිරීම සහ එමඟින් ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයක් හා සෞඛ්‍ය තත්ත්වයක් වර්ධනය කිරීම් වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,515 කට සමාන ජපන් යෙන් මිලියන 6,817 ක් වන අතර ඉන් රු.මිලියන 8,726 කට සමාන ජපන් යෙන් මිලියන 5,166 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරි මස ආරම්භ කර තිබුණු අතර, 2018 පෙබරවාරි මස වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාල සීමාව 2022 ජූලි 05 දින දක්වා දෙවරක් දීර්ඝ කර ඇත.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

---

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | මුදල<br>රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දක්වා මහා භාණ්ඩාගාරය විසින් සිදුකරන ලද සමානාත්මතා ගැලපුම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 අනුව මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. | 579.74 | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය අංශයේ නිර්දේශ මත පදනම්ව 2022 මූල්‍ය ගිණුම් සඳහා අවශ්‍ය ඇතුලත් කිරීම් සැපයීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශණ වෙත සමානාත්මතාවය ගැලපීම ගෙන ආ යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල සහ ශ්‍රී ලංකා ජනරජ ගිණුමේ ණය ශේෂයන් ප්‍රතිසන්ධානය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ විශේෂ (යෙන්) ගිණුමේ මාසික බැංකු ප්‍රකාශණ විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන්, කෙරීගෙන යන වැඩ ගිණුම යටතේ පෙන්වා ඇති 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ විදේශ ගනුදෙනුවල විනිමය | 154.44 | සෑම වසරකම අවසානයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් විශේෂ (යෙන්) ගිණුම් ප්‍රකාශයක් මහ | මාසික බැංකු ප්‍රකාශන නියමිත වේලාවට විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ලාභය විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | බැංකුවෙන් ඉල්ලා ඇත. නමුත් මහ බැංකුව එවැනි ප්‍රකාශනයන් නිකුත් නොකරයි. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතිය 2013 පෙබරවාරි මස එහි කටයුතු ආරම්භ කරන ලද අතර වසර 05 ක් ඇතුලත 2018 පෙබරවාරි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කාලසීමාව 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කල දින සිට වසර 08 කුත් මාස 10 ක් ගත වී තිබුණද, ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 95.78 ක් සහ සියයට 65.21 ක් ලෙස පැවතුණි. කෙසේවෙතත්, සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ ව්‍යාපෘතිය ලබාගෙන තිබුනේ භෞතික ප්‍රගතියන් සියයට 15.41 ක් පමණි. 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ එක් එක් ක්‍රියාකාරකම් වල සමුච්චිත ප්‍රගතිය පහත පරිදි වේ.

| | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 වන විට<br>අපේක්ෂිත ඉලක්ක ප්‍රතිශතය | 2021 දෙසැම්බර් 31 වන විට<br>ළඟාකරගත් ඉලක්ක ප්‍රතිශතය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|
| (අ) | උපදේශන සේවාව | 90.60 | 89.5 | නියමිත කාල සීමාව තුල අපේක්ෂිත උපදේශන සේවාව ලබාගැනීමට නොහැකි වී ඇති අතර එය උපදේශන කාලය දීර්ඝ කිරීමට හේතුවිය හැක. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යයි. | උපදේශන කොන්ත්‍රාත්තුව 2022 මැයි 31 දක්වා දීර්ඝ කර තිබූ අතර මේ දක්වා තව දුරටත් දීර්ඝ කිරීමක් ලබාදී නොමැත. දැනට සිටින උපදේශකයින් කාල දිගුවක් අපේක්ෂාවෙන් අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා සහාය වේ. | ඉදිකිරීම් කටයුතු නියමිත රාමුව තුළ නිම කිරිම සඳහා උපදේශකයා විසින් සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ආ) | තුළුමුව පහසුකම්, ජල පවිත්‍රාගාරය, භූගත ජලාශ, ජල කුළුණු, කාර්යාල ගොඩනැගිලි, යාන්ත්‍රික හා විදුලි වැඩ (කැබලි අක්ෂර ඒ) | 99.8 | 98.2 | ව්‍යාපෘතිය නිම කිරීමට හා ව්‍යාපෘති අරමුණු කෙරෙහි අහිතකර ලෙස බලපායි. | අර්ධ නිම කිරීමේ සහතිකයක් නිකුත් කිරීම සහ වැඩ භාරදීම සිදු වෙමින් පවතී. | ඉතිරි වැඩ අවසන් කිරීමට සහ කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීමට උපදෙස් දිය යුතුය. |
| (ඇ) | සම්ප්‍රේෂණ ප්‍රධාන සහ උප ප්‍රධාන - මිලිමීටර් 110 සිට මිලිමීටර් | 96.8 | 94.0 | එය ව්‍යාපෘති කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකිය. | කොන්ත්‍රාත්තුව 2022.11.30 දක්වා දීර්ඝ කිරීමට ජාතික ජලසම්පාදන හා | තවදුරටත් ප්‍රමාදයකින් තොරව කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමටත් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 500 විශ්කම්භය දක්වා - කිලෝමීටර් 88.7 හා බෙදාහැරීම් ප්‍රධාන (අධි තාක්ෂණික පොලි එතලින් නල ) - මිලිමීටර් 110 සිට මිලිමීටර් 400 විශ්කම්භය දක්වා - කිලෝමීටර් 163 (කැබලි අක්ෂර බී) | | | | ජලාපවහන මණ්ඩලයෙහි නිර්දේශ සකසමින් පවතී. රටේ ඉන්ධන හිඟය සහ රටේ ආර්ථික දුෂ්කර කාල පරිච්ඡේදයේදී මුදල් ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්කරුට නියමිත පරිදි වැඩනිමකිරීමට නොහැකි විය. | කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීමටත් උපදෙස් දිය යුතුය. |
| (ඈ) | ඉසින්බැස්සගල කලාපයේ යූ.පී.වී.සී.නල ඇතිරීම සවිකිරීම් හා විශේෂ සහ මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල ඇතිරීම, සවිකිරීම් හා විශේෂ (කැබලි අක්ෂර සී-1) | 100 | 95 | කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද වීම ව්‍යාපෘති කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකිය. | කොන්ත්‍රාත්කරු වැඩබිමට පැමිණ නල ජාලය සෝදාහැරීම් සහ විෂබීජහරණය කිරීම සඳහා සූදානම් වෙමින් සිටියි. | නියමිත කාල රාමුව තුල ඉතිරි කාර්යයන් සම්පූර්ණ කීරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ඉ) | රබෑව, නැගෙනහිර රබෑව සහ ඇතාකඩ කළාපයේ යූ.පී.වී.සී. නල ඇතිරීම, සවිකිරීම් හා විශේෂ සහ මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල ඇතිරීම, සවිකිරීම් හා විශේෂ | 100 | 95 | කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද වීම ව්‍යාපෘති කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකිය | සෝදාහැරීම් හා විෂබීජහරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. | නියමිත කාල රාමුව තුළ ඉතිරි කාර්යයන් සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන සිවිල් කොන්ත්‍රාත්තුව වන තුළුමුව පහසුකම්, ජල පවිත්‍රාගාරය, භූගත ජලාශ, ජල කුළුණු , කාර්යාල ගොඩනැගිලි, යාන්ත්‍රික හා විදුලි වැඩ (කැබලි අක්ෂර ඒ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 23 දින ප්‍රධානය කරන ලද අතර එය 2020 අප්‍රේල් 20 වන විට අවසන් කිරීමට මුලින් සැලසුම් කර තිබුනි. පසුව නියමිත දිනට කොන්ත්‍රාත්තුව අවසන් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් කාලය 2022 මාර්තු 31 දක්වා 06 වතාවක් දීර්ඝ කර ඇත. ව්‍යාපෘතියේ කාර්යසාධන වාර්ථාවට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 98.2 ක් වූ අතර කොන්ත්‍රාත්තුවේ අවසාන දීර්ඝ කිරීමේ දිනය වන 2022 මාර්තු 31 දිනට එය සියයට 99 ක් ව පැවතුණි. කෙසේ වෙතත්, 2022 ජූනි 30 වන විටත් කොන්ත්‍රාත්තුව යටතේ කිසිඳු ඉදිකිරීම් කටයුත්තක් සම්පූර්ණයෙන් නිම කර ව්‍යාපෘතියට භාරදී නොතිබුණි. 2022 මාර්තු 31 දින සිට ව්‍යාපෘතියෙන් තවදුරටත් කාලය දීර්ඝ කිරීමක් ලබාදී නොතිබුණද කොන්ත්‍රාත්තුවේ ඉතිරි කාර්යයන් නිසි කාල දිගුවක් ලබා නොගෙන කොන්ත්‍රාත්කරු විසින් සිදුකරනු ලැබේ. | 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය, 2019 රජයේ ප්‍රතිපාදන හිඟවීම නිසා මාස 8 ක බිල්පත් නොගෙවීම, 2020 අප්‍රේල් කොවිඩ් හේතුවෙන් රට වසා දැමීම, 2022 ඉන්ධන හිගවීම, 2022 අප්‍රේල් සිට මේ දක්වා ජපන් සහයෝගීතා ආයතනය විසින් බිල්පත් කිසිවක් නොගෙවීම යනාදී ප්‍රධාන හේතු කිහිපයක් නිසා ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද විය. ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් කොන්ත්‍රාත්කරුවන් සමඟ වැඩ නතර නොකිරීමට සාකච්ජා කර ඇති අතර ඉහත හේතු තිබියදීත්, මේ වන විට ව්‍යාපෘතියේ ප්‍රධාන කටයුතු පාහේ අවසන් කර ඇත. | ඉතිරි වැඩ අවසන් කිරීමට සහ කොන්ත්‍රාත්කරුගේ වැඩ සම්පව නිරීක්ෂණය කිරීමට උපදෙස් දිය යුතුය. |
| (ආ) | ප්‍රධාන නල ඇතිරීමේ කොන්ත්‍රාත්තුව වන අධි තාක්ෂණික පොලි එතලින් නල සම්ප්‍රේෂණ ප්‍රධාන කිලෝමීටර් 88.7 ක් සහ අධිතාක්ෂණික පොලි එතලින් නල බෙදාහැරීම් ප්‍රධාන කිලෝමීටර් 163 ක් සැපයීම් හා ඇතිරීමේ කොන්ත්‍රාත්තුව (කැබලි අක්ෂර බී) 2019 දෙසැම්බර් 31 වන විට මාස 24 ක් ඇතුලත නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, නල එලීම, සම්පීඩන පරීක්ෂා කිරීම, පීඩන පරීක්ෂාව, සෝදාහැරීම් හා විෂබීජහරණය, කපාට කුටි සවිකිරීම, බෝක්කු හා පාලම් හරස්මාර්ග සැකසීමේ කටයුතු යනාදිය සම්බන්ධයෙන් වන ඉතිරි කටයුතු 2022 ජූනි 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘතියේ සංශෝධිත නිම කිරීමේ දිනයට පෙර කොන්ත්‍රාත්තුවේ ඉතිරි කටයුතු අවසන් කළ හැකිද යන්න විගණනයට සැකසහිත බව නිරීක්ෂණය වේ. එහි ප්‍රතිඵලයක් ලෙස කැබලි අක්ෂර සී-1 සහ කැබලි අක්ෂර සී -3 යන අනෙකුත් බෙදාහැරීමේ නල එලීම් කොන්ත්‍රාත්තුන්හි සෝදාහැරීමේ හා විෂබීජහරණය කිරීමේ කටයුතු අවසන් කර 2022 ජූනි 30 වන විටත් කැබලි අක්ෂර - බී කොන්ත්‍රාත්තුව අවසන් වන තෙක් භාරදීමට නොහැකි විය. | 2022.11.30 දක්වා කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමේ නිර්දේශය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි සකසමින් පවතී. රටේ ඉන්ධන හිඟය සහ රටේ ආර්ථික දුෂ්කර කාල පරිච්ජේදයේදී මුදල් ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්කරුට නියමිත පරිදි වැඩ නිම කිරීමට නොහැකි විය. | කොන්ත්‍රාත්තුව තවදුරටත් ප්‍රමාද නොකර සම්පූර්ණ කිරීමට උපදෙස් දිය යුතු අතර කොන්ත්‍රාත්කරුගේ වැඩ සම්පව නිරීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | බෙදාහැරීම් නල ඇතිරීම් කොන්ත්‍රාත් වන ඉසින්බැස්සගල කලාපයේ කිලෝමීටර් 115 ක් දුරට යූ.පී.වී.සී, මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල ඇතිරීමේ කොන්ත්රාත්තුව (කැබලි අක්ෂර සී - 1) සහ රබෑව, නැගෙනහිර රබෑව සහ ඇතාකඩ කලාපයේ කිලෝමීටර් 119.6ක් දුරට යූ.පී.වී.සී, මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල ඇතිරීමේ කොන්ත්‍රාත්තුව (කැබලි අක්ෂර සී - 3) පිළිවෙලින් 2020 පෙබරවාරි 29 සහ 2019 ජූලි 15 දින සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුව යටතේ බෙදාහැරීම් ප්‍රධාන සහ සම්ප්‍රේෂණ අවසන් වන තෙක් කොන්ත්‍රාත්කරුවන් විසින් නල මාර්ග සෝදාහැරීම හා විෂබීජහරණය කිරීමේ කටයුතු අත්හිටුවීම හේතුවෙන් කොන්ත්‍රාත් 2ම 2022 ජූනි 30 දින වන විටත් අවසන් කර භාරදී නොතිබුණි. | සෝදාහැරීම වෙනුවෙන් ජලය ලබාගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජාතික සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර සාකච්ඡා කෙරෙමින් පවතී. | නියමිත කාලරාමුව තුළ ඉතිරි වැඩ අවසන් කිරීමට ඵලදායී පියවර ගත යුතුය. |
| (ඇ) | සවිස්තරාත්මක නිර්මානකරණය, ටෙන්ඩර් ලේඛණ සකස් කිරීම, ප්‍රසම්පාදන සහාය සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශන කොන්ත්‍රාත්තුව 2014 ජූනි 13 වන දින ජපන් යෙන් මිලියන 129 ට සමාන රුපියල් මිලියන 218 ක පිරිවැයකට ප්‍රදානය කරන ලද අතර එය 2017 සැප්තැම්බර් 14 දින වන විට මාස 38 ක් ඇතුලත අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. පසුව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය සහ සිවිල් කොන්ත්‍රාත්තුවල අඩු ප්‍රගතිය හේතුවෙන් උපදේශන කොන්ත්‍රාත්තුවේ කාලසීමාව 2022 මැයි 31 දක්වා 04 වතාවක් දීර්ඝ කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, ජපන් යෙන් මිලියන 27.72 ට සමාන රුපියල් මිලියන 124.96 ක මුදලක් එනම් එකඟ වූ කොන්ත්‍රාත් මුදලින් සියයට 51.86 ක් කාලය දීර්ඝ කිරීම මත අතිරේක උපදේශන වියදම් ලෙස ගෙවා ඇත. | කාල දිගුවක් ලබාදෙනු ඇතැයි අපේක්ෂාවෙන් ව්‍යාපෘතිය අවසන් වන තෙක් ව්‍යාපෘති කටයුතු සඳහා සහායවීමට උපදේශකයින් එකඟ විය. | ඉදිකිරීම් කටයුතු නියමිත කාලරාමුව තුළ නිම කිරීම සඳහා උපදේශකයා විසින් සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ඉ) | කැබලි අක්ෂර ඒ කොන්ත්‍රාත්තුව යටතේ මහකනදරාව පවිත්‍රාගාර පරිශ්‍රයේ භාරකාර නිල නිවාසයක් ඉදිකිරීමට මෙම ව්‍යාපෘතිය මඟින් මුලින් සැලසුම් කර තිබුණි. පසුව එය වෙනස් කර 2020 දෙසැම්බර් 02 වන දින උතුරු මැද ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ පැවති රැස්වීමේදී සාමාන්‍යාධිකාරීවරයාගේ ඉල්ලීම මත මිහින්තලේ සංචාරක බංගලාවක් ඉදිකිරීමට තීරණය කර ඇත. කෙසේ වෙතත්, ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමට පෙර ඉහත පරිදි විෂය පථය වෙනස් කිරීම සඳහා ජපන් සහයෝගීතා ආයතනයේ හෝ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාගේ ලිඛිත අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2020 නොවැම්බර් 27 වන දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීගේ වැඩබිම්හි ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම විකල්පය නිර්මාණය කරන ලද අතර 2020 දෙසැම්බර් 02 දිනැති විශේෂ රැස්වීමේදී සටහනක් තබන ලදී. | වෙනම පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නිසි විචලන ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය. |

## 3.3 නිශ්ක්‍රිය, උපයෝජනය නොකළ, සම්පත් ඌණ උපයෝජනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘතිය විසින්, ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට වසර 05 ක් වෙනුවට 2022 ජුනි 30 වැනි දිනට වසර 09 මාස 04 ක් ගතකර තිබුණද, සැලසුම් කළ පරිදි ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා කිසිදු කාර්යයක් සම්පූර්ණයෙන් නිම කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දී නොතිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති වැඩ නිම කිරීමට සහ එකඟ වූ ණය මුදල සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට පෙර එසේම ව්‍යාපෘතිය මඟින් රජය සහ මහජනයා අපේක්ෂා කළ අරමුණු සාක්ෂාත් කර ගැනීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දින දක්වා එකඟ වූ ණය මුදල ඌණ උපයෝජනය හේතුවෙන් බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 45.68 ක් සහ ජපන් යෙන් මිලියන 558.51 කට සමාන රු.මිලියන 994.38 ක ප්‍රාග්ධන ආපසු ගෙවීම් රජය විසින් ගෙවා ඇත. | ව්‍යාපෘතියේ සුළු ක්‍රියාකාරකම් කලින් ආරම්භ කළද ප්‍රධාන කොන්ත්‍රාත් පැකේජ 2018 දී වාගේ ප්‍රදානය කර ඇත. ව්‍යාපෘතියේ සැලකිය යුතු නිමාවක් අත්කර ගැනීමට ව්‍යාපෘති සංරචක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාරදීම දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. | ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වන පරිදි රජයේ සහ මහජන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තවදුරටත් ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය නිම කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කැබලි අක්ෂර බී, කැබලි අක්ෂර සී - 1, කැබලි අක්ෂර සී - 3 කොන්ත්‍රාත්තු සහ කැබලි අක්ෂර ඒ කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ නිම නොවීම හේතුවෙන් 2022 ජුනි 30 වන විට ව්‍යාපෘතිය සමස්ථ භෞතික ප්‍රගතියෙන් සියයට 97.46 ක් පමණක් ළඟාකර ගෙන තිබුණි. මීට අමතරව රජය විසින් ණය ආපසු ගෙවීම නවතා දැමීම හේතුවෙන් 2022 මාර්තු සිට 2022 ජුනි දක්වා කැබලි අක්ෂර ඒ, කැබලි අක්ෂර බී හා කැබලි අක්ෂර සී - 3 කොන්ත්‍රාත්තුන්ට අදාල රු.මිලියන 303.72 ක කොන්ත්‍රාත් බිල් වටිනාකමක් ගෙවීම ණය නියෝජිතායතනය විසින් අත්හිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහත කොන්ත්‍රාත්තුන්හි ඉතිරි වැඩ නිම කිරීම තවදුරටත් ප්‍රමාද විය හැකි අතර කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවිය හැකිවේ. | රජයේ ණය සඳහා ප්‍රාග්ධන ආපසු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් ණය නියෝජිතායතනය මුදල් ගෙවීම නතර කර ඇත. | ප්‍රමාදයකින් තොරව කොන්ත්‍රාත්තුන් අවසන් කිරීමට ක්‍රියාකළ යුතු අතර හිඟ බිල්පත් පියවීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කළ යුතුය. |
| (ආ) | අදියර - 01 හි ව්‍යාපෘති සංදේශයට අනුව, ව්‍යාපෘතිය නිම කිරීමට නියමිත දිනය 2018 පෙබරවාරි විය. පසුව කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම ප්‍රමාද වීම, කැබලි අක්ෂර ඒ සහ කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුවල දුර්වල කාර්යසාධනය සහ | ප්‍රධාන කොන්ත්‍රාත් පැකේජ 2018 දී පාහේ ප්‍රදානය කරන ලද බැවින් මෙම ව්‍යාපෘතිය 2018 වන විට අවසන් කිරීමට සැලසුම් කර නොමැත. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය කාලසටහන් තුළ අවසන් කළ |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුවන්ගේ මන්දගාමී ප්‍රගතිය යනාදිය හේතුවෙන් එය 2022 ජූලි මාසය දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, දිර්ඝ කරන ලද ව්‍යාපෘති කාල සීමාව සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කාර්යාලය හා අනෙකුත් වැඩබිම් කාර්යාල නඩත්තු කිරීම සඳහා අතිරේක පොදුකාර්ය පිරිවැය ලෙස රු.මිලියන 179.9 ක් ව්‍යාපෘතිය සඳහා දැරීමට සිදු විය. | | යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, සාමාන්‍ය පරිපාලන වියදම් ණය මුදලින් මූල්‍යකරණය සඳහා සුදුසුකම් නොලබන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 3.6 ක මුදලක් සහ 2022 මාර්තු මාසය දක්වා රු.මිලියන 2.36 ක මුදලක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අනුයුක්ත කර ඇති ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ 05 දෙනෙකු සඳහා වැටුප් ගෙවා ඇත. | ව්‍යාපෘතිය යටතේ බඳවාගත් කාර්ය මණ්ඩලයේ හිඟකම සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා වෙනත් ව්‍යාපෘති වෙත කාර්ය මණ්ඩලය මාරු කිරීම හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් ලබාගත් අනුමැතිය මත මෙම ගෙවීම් සිදුකරනු ලැබේ. | ණය මුදල් මඟින් සුදුසුකම්ලත් වියදම් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග සඳහා නිකුත් කර තිබූ රු.මිලියන 69.45 ක බැංකු ඇපකර වටිනාකම 2021 සැප්තැම්බර් 06 දිනෙන් අවසන් විය. එබැවින් කැබලි අක්ෂර බී කොන්ත්‍රාත්තුවේ නල එලීමේ කටයුතු අවසන් නොවීම හේතුවෙන් 2022 මාර්තු 06 දක්වා තවදුරටත් දීර්ඝ කරන ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා ප්‍රධාන කාර්යාලයෙන් ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, ප්‍රධාන කාර්යාලය බැංකු ඇපකරය වෙනුවෙන් දිගුකාලයක සිට ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවක් විවෘත කර කොමිස් මුදල් ලෙස රු.මිලියන 3.17 ක් ගෙවා තිබීම හේතුවෙන් එය ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රතික්ෂේප වී තිබුණි. එබැවින් 2022 ජූලි 31 දින වන විටත් කැබලි අක්ෂර බී, කැබලි අක්ෂර සී -1 සහ කැබලි අක්ෂර සී -3 කොන්ත්‍රාත්තුවල නල එලීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී නොමැති බවත් මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග සඳහා වන බැංකු ඇපකරය කල් ඉකුත් වී ඇති අතර එය 2021 සැප්තැම්බර් 06 සිට නිකුත් කර නොමැති බවත් නිරීක්ෂණය විය. | 2022 ජූලි මාසයට පෙර කැබලි අක්ෂර බී, සී 1 හා සී 3 මඟින් මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග නිමකරන ලදී. බැඳුම්කර අලුත්කිරීම ඉල්ලා සිටියේ නැත. | බැංකු ඇපකර ඉල්ලීම වැළැක්වීම සඳහා මාර්ග සම්පූර්ණ කර භාරදීමට වහාම පියවර ගත යුතුය. |

**3.5 පද්ධති හා පාලනයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| 2010 ජූලි 26 දිනැති අංක 05 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතියේ කටයුතු 2021 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | සාමාන්‍යයෙන් ආරම්භයේ සිටම ව්‍යාපෘති ක්‍රියාකාරකම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය මඟින් විගණනය කර ඇත. නමුත් 2021 දී විගණකවරුන් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය වෙත පැමිණියේ නැත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |